# අභිලාෂය ප්‍රකාශ කිරීමේ ඉල්ලීම (REoI)

## පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය
## මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
## ණයවර අංක - 5792 LK

## කොන්ත්‍රාත් අංක - LK-ESCAMP-PMU-29024-CS-INDV
## සමාජ විද්‍යාඥ / සමාජ-ආර්ථික සංවර්ධන විශේෂඥ

## කොන්ත්‍රාත් අංක - LK-ESCAMP-PMU-29022-CS-INDV
## භූමි පරිහරණ විශේෂඥ

## උපදේශන සේවාවේ පසුබිම

ලෝක බැංකු ආධාර මත මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය සහ තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය එක්ව ක්‍රියාත්මක කරනු ලබන පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතියේ වැඩසටහන්, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මගින් ක්‍රියාවට නංවනු ලබයි.

මෙම ව්‍යාපෘතියේ සංරචක අංක 1 යටතේ තෝරාගත් භූ දර්ශන දෙකක භූ දර්ශන සැලසුම්කරණය සහ කළමනාකරණය සඳහා තෝරාගත් ප්‍රදේශ දෙකක නියමු කළමනාකරණ සැලසුම් සැකසීමට අවශ්‍ය මාර්ගෝපදේශන රාමුවක් සකස් කිරීම, තාක්ෂණික සහය හා ආයතනික හැකියාවන් ඉහළ නැංවීම අපේක්ෂා කෙරෙයි.

මෙම කාර්යයට සහය දැක්වීම සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයාගේ අධීක්ෂණය යටතේ 1) සමාජ විද්‍යාඥ/සමාජ-ආර්ථික සංවර්ධන විශේෂඥවරයෙකුගේ සහ, 2) ඉඩම් පරිහරණය පිළිබඳ විශේෂඥවරයෙකුගේ උපදේශන සේවා, ලබා ගැනීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය අපේක්ෂා කරනු ලබයි.

භූ දර්ශන සැලසුම් සකස්කිරීම සඳහා දැනට හුරුළු (FR) ආනවිලුන්දාව (PR) කවුඩුල්ල (NP) වනාන්තර හා ඒ ආශ්‍රිත මුළු භූ දර්ශන ප්‍රදේශය හඳුනාගෙන ඇත (පහළ මහවැලි ගංගා ජලාධාර ප්‍රදේශය).

### 1) සමාජ විද්‍යාඥ / සමාජආර්ථික සංවර්ධන විශේෂඥ

මෙම තනතුර සඳහා අවැසි මූලික සුදුසුකම් සහ රැකියා විස්තරය පහත දක්වා ඇත.

#### A) රැකියා විස්තරය

a) භූ දර්ශන සංරක්ෂණය සඳහා සැලකිය යුතු මට්ටමේ බලපෑම් එල්ල කරන්නා වූ ප්‍රධාන පාර්ශවකරුවන් හඳුනා ගැනීම
b) තෝරාගන්නා ලද භූ දර්ශනය ආශ්‍රිතව වෙසෙන ජනතාවගේ සමාජ- ආර්ථික තත්ත්වය ඇගයීමට ලක් කිරීම
c) අවශ්‍ය මූලික දත්ත හා තොරතුරු එක්රැස් කිරීම, සමාලෝචනය, වාර්තා කිරීම සහ අවශ්‍ය ක්ෂේත්‍ර ඇගයීම් සිදු කිරීම
d) රක්ෂිත ප්‍රදේශ මත ප්‍රජාවගේ යැපීම් පිළිබඳ තක්සේරුකිරීම සහ සංරක්ෂණය සඳහා ඇති අභියෝග හඳුනා ගැනීම
e) භූමි හායනය, ආර්ථික සංවර්ධනය මත සිදුවන පාරිසරික පරිහානිය හා ඒ ආශ්‍රිත බලපෑම් තක්සේරු කිරීම

f) රක්ෂිත ප්‍රදේශ ආශ්‍රිත සංරක්ෂණ කටයුතු සඳහා සිදුවන බලපෑම් හේතුවෙන් ඒ ආශ්‍රිත ප්‍රජාවගේ යැපීම් මට්ටම මත ගම්මාන ශ්‍රේණිගත කිරීම සහ එම ස්ථාන සිතියම්ගත කිරීම
g) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට රක්ෂිත ප්‍රදේශ ආශ්‍රිත ස්වාරක්ෂක කලාපයෙහි සහ පරිවාරක කලාපයන් හි වාසය කරන ප්‍රජාව හා එක්ව කටයුතු කිරීම සඳහා අවශ්‍යවන තාක්ෂණික හා මාර්ගෝපදේශන සේවාවන් සැපයීම
h) ව්‍යාපෘති ක්‍රියාකාරකම් සිදුකරන ප්‍රදේශයන් හි දැනට ක්‍රියාත්මක වන ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් හි සාර්ථකත්වය, කාර්යක්ෂමතාවය, ඒ ඔස්සේ ඇති වූ බලපෑම් සහ දුර්වලතාවයන් පිළිබඳව විශ්ලේෂණ කිරීම
i) ඉහත දක්වා ඇති සමාජ ආර්ථික විශ්ලේෂණයන්ගේ සොයාගැනීම් මත ග්‍රාමීය ආර්ථික සංවර්ධනය සහ ජීවනෝපාය වැඩිදියුණු කිරීම සඳහා අවැසි නිර්දේශ සහ යෝජනා ලබා දීම

**B) කාලය - මාස 4 ක් (පූර්ණ කාලීන)**

**C) අධ්‍යාපනික සුදුසුකම් හා පළපුරුද්ද**

i). සමාජ විද්‍යාව/ කෘෂි විද්‍යාව/ස්වාභාවික සම්පත් කළමනාකරණය පිළිබඳ මූලික උපාධියක් හෝ සාමාජ-ආර්ථිකවිද්‍යාව/ ග්‍රාමීය සංවර්ධනය/ පිළිබඳ සම්පත් ආර්ථිකවිද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය සමඟ අදාළ ක්ෂේත්‍රයේ විද්‍යාපති උපාධියක් හෝ අදාළ ක්ෂේත්‍රයේ වෙනත් පශ්චාත් උපාධියක්

ii). සමාජ ආර්ථික ව්‍යාපෘති ඇගයීම, සමාජීයකරණය, ග්‍රාමීය සංවර්ධනය / ප්‍රජා සංවර්ධනය සහ සමාජ ආර්ථික සංවර්ධනය ආශ්‍රිත ක්‍රියාකාරකම් හි වසර 10 ක පළපුරුද්ද

iii). රක්ෂිත ප්‍රදේශ හා පරිවාරක කලාපයන් ආශ්‍රිතව ඉහත දක්වා ඇති ක්ෂේත්‍රයන්ගේ අවම වශයෙන් වසර 5 ක සේවා පළපුරුද්ද

**2) භූමි පරිහරණ විශේෂඥ**

**A) රැකියා විස්තරය**

a) තෝරාගත් භූ දර්ශනය තුළ පවත්නා ඉඩම් පරිහරණ රටාවන් අධ්‍යයනය,හඳුනාගැනීම සහ වර්ගීකරණය කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීම
b) දැනට භූ දර්ශන සැලසුම් සකස් කිරීම සඳහා හඳුනාගත් ස්ථානයන් හි පාර්ශවකරුවන් හඳුනාගැනීම සහ භූමි පරිහරණ සැලසුම් සකස් කිරීම සම්බන්ධ දැනට පවත්නා භූමි පරිහරණ ප්‍රතිපත්ති, නීතිරීති, රෙගුලාසි හා නියාමන රාමුව සමාලෝචනය කිරීම
c) භූ දර්ශන කළමනාකරණ සැලසුම් සකස් කිරීම සඳහා යෝජිත ප්‍රදේශයේ මායිම් පිළිබඳ සමාලෝචනය (අවශ්‍ය නම් පමණක්), ප්‍රධාන පාර්ශවකරුවන්ගේ වත්මන් හා අනාගත ඉඩම් අවශ්‍යතා හඳුනාගැනීම, එම අවශ්‍යතා ඉටුකිරීමට අවැසි භූමි ධාරිතාවය විශ්ලේෂණය සහ ගැටලුකාරී තත්තවයන් ඇති වීමේ විභවතාව සමාලෝචනය කිරීම
d) උපදේශකවරයා විසින් 1) රක්ෂිත ප්‍රදේශ සඳහා ඇති තර්ජන 11) භූමි පරිහරන කළමනාකරණයේ දී හා භූමි හායනයේ දී බලපාන සාධක හඳුනාගැනීම සහ විශ්ලේෂණය සිදු කිරීම
e) තිරසාර නොවන භූමි පරිහරණ රටාවන් සහ භූමි හායනය හේතුවෙන් ඇති වී තිබෙන ප්‍රධාන පාරිසරික ගැටලු හඳුනාගැනීම

f) අලි - මිනිස් ගැටුම් උද්ගතව ඇති ප්‍රදේශයන්ට අවධානය යොමු කරමින් ඒවා අවම කරගැනීමට හා එම ප්‍රදේශයන්ට යෝග්‍ය භූමි පරිහරණ සැලසුම් යෝජනා කිරීම මෙම උපදේශන සේවාව ඔස්සේ අපේක්ෂා කෙරෙයි.
g) එම ප්‍රදේශයන් හි දැනට පවතින වෙනත් භූමි පරිහරණ සැලසුම් හා ක්‍රියාකාරකම් පිළිබඳ අවධානය යොමු කරමින් එම තොරතුරු එක්රැස් කිරීම
h) ව්‍යාපෘති කාර්යය මණ්ඩලය ද ඇතුළත්ව දත්ත එක්රැස් කිරීම හා දත්ත එක්රැස් කිරීමේ ක්‍රමවේදයන් සැකසීම සහ ඒ සඳහා අවශ්‍ය පුහුණුව ලබා දීම

**B) කාලය - මාස 4 ක් (පූර්ණ කාලීන)**

**C) අධ්‍යාපනික සුදුසුකම් හා පළපුරුද්ද**

I. කෘෂිකර්මය, ජීව විද්‍යාව හෝ ස්වාභාවික සම්පත් කළමනාකරණය පිළිබඳ මූලික උපාධියක් සමඟ ශෂ්‍ය විද්‍යාව, කෘෂි ආර්ථික විද්‍යාව,පාරිසරික වන විද්‍යාව හෝ ස්වාභාවික සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධියක් හෝ අදාළ ක්ෂේත්‍රයේ වෙනත් උපාධියක්.
II. කෘෂිකාර්මික පද්ධති, භූමි පරිහරණ සැලසුම්කරණය, පාංශු හා ජල සංරක්ෂණය වැනි ක්ෂේත්‍රයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 10 ක පළපුරුද්ද
III. ඉහත දැක්වෙන ක්ෂේත්‍රයන්ට අනුකූලව ස්වාභාවික සම්පත් කළමනාකරණය, රක්ෂිත ප්‍රදේශ ආශ්‍රිත පරිවාරක කලාපයන් හි අවම වශයෙන් වසර 5 ක සේවා පළපුරුද්ද
IV. අයදුම්කරුට Geographic Information System (GIS) සම්බන්ධයෙන් සහ භූමි පරිහරණ සැලසුම් සැකසීම හා ඒ ආශ්‍රිත ඇගයීම් සම්බන්ධ පළපුරුද්ද ඇති අයට ප්‍රමුඛතාවය දෙනු ලැබේ

**වේතනය:** අධ්‍යාපනික සුදුසුකම් හා පළපුරුද්ද මත පදනම්ව සාකච්ඡා කොට තීරණය කරනු ලැබේ.

**තෝරා ගැනීමේ නිර්ණායක**

අධ්‍යාපනික සුදුසුකම් හා පළපුරුද්ද පදනම්කොටගත් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සිදු කෙරෙයි. විදේශ ආධාර මත ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතින් හි පළපුරුද්ද අමතර සුදුසුකමක් සේ සලකනු ඇත.

ලෝක බැංකුවේ උපදේශන සේවා සැපයීමේ මාර්ගෝපදේශ සංග්‍රහය : ලෝක බැංකුව විසින් අරමුදල් සැපයෙන ආයතනවල උපදේශන සේවා සැපයීම: ජනවාරි 2011, ජූලි 2014 (සංශෝධිත) අනුකූලව උපදේශකවරුන් තෝරා ගැනීම සිදු කෙරෙයි.

**අයදුම් කිරීම**

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් සුදුසුකම් සහිත පුද්ගලයින්ගෙන් අභිලාෂය ප්‍රකාශ කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ. ඒ සඳහා උනන්දුවක් දක්වන ඉල්ලුම්කරුවන් මෙම තනතුරට අදාළ යොමු කිරීම් සහ ඉල්ලුම්පත් , තම ජීව දත්ත පත්‍රිකාව (සුදුසුකම් හා පළපුරුද්ද, මීට සමාන පැවරුම් විස්තර, අදළා කුසලතාවයන් ආදිය ඇතුළත්ව) ඉදිරිපත් කළ යුතුය.

රාජ්‍ය අංශයේ අයදුම්කරුවන් විසින් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කළ යුතුය.

මේ සඳහා අදාළ සවිස්තරාත්මක යොමු කිරීමේ අනුදේශ (Terms of Reference – ToR), පරිසර අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙන් www.environmentmin.gov.lk ලබා ගත හැකිය. මේ සඳහා

ඉල්ලුම්කිරීමට උනන්දුවක් දක්වන අයදුම්කරුවන් ට 2017 සැප්තැම්බර් 25 දින සිට රාජකාරී දිනවල පැය 0900 සිට පැය 1530 දක්වා කාලය තුළදී පහත දැක්වෙන දුරකථන අංකය හෝ ඊ-තැපෑල ඔස්සේ ලබා ගත හැකිය.

සියලුම අයදුම්පත් 2017 ඔක්තෝම්බර් 10 වැනි දිනට ප්‍රථම ලියාපදිංචි තැපැල ඔස්සේ, අයදුම් කරන තනතුර පැහැදිලිව ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ දක්වා පහත සඳහන් ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය.

ව්‍යාපෘති අධ්‍යක්ෂක **- ESCAMP**,
පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය,
ව්‍යාපෘති කළමනාකරණ ඒකකය,
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය,
"සම්පත්පාය", අංක 82, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල
දුරකථන : 0113355585
ෆැක්ස්: 0112791278
ඊ තැපෑල: escamp.procurement@gmail.com
2017 සැප්තැම්බර් 25